අප විසින් කටවහරේ භාවිතා කරනා ඇතැම් යෙදුම්, විශේෂයෙන්ම සෘණාත්මක සන්දර්භයන් තුළදී නිෂේධනාත්මක ස්වරයන් සහ අරුත් හා බැඳී තිබෙන අතර, එවැනි යෙදුම් මාධ්‍ය තුළ භාවිතා කිරීමට පෙර දෙවරක් සිතා බැලිය යුතුවේ. ඊට උදාහරණයක් ලෙසින් "චීනා" වැනි යෙදුමක් දැක්විය හැක. සෘණාත්මක සන්දර්භයක දී චීන ජාතිකයෙකු හැඳින්වීමට "චීනා" වැනි යෙදුමක් යොදාගැනීමේදී එහි අන්තර්ගත වන අවමානාත්මක ස්වරය නිසා, එවැනි යෙදුම් මාධ්‍ය තුළ දිගින් දිගටම යෙදීම ඔස්සේ විදේශික භීතිකාවක් (xenophobia) පවා ජනිත නොවනු ඇතිද?
"ව්‍යාජ ක්‍රෙඩිට් කාඩ් පත් 30 ක් සමග චීනා ඇතුළු සිව් දෙනෙකු දැලේ" යනුවෙන් දිවයින පුවත්පතේ දැක්වී ඇති සිරස්තලය ඊට නිදසුනකි. කෙසේ වෙතත්, මව්බිම පුවත්පත මෙම පුවත ඉදිරිපත් කරන්නේ "චීන ජාතිකයකු හවුල් කරගෙන ශ්‍රී ලාංකිකයන් තිදෙනෙක් ව්‍යාජ ක්‍රෙඩිපත් හදලා" යන උපසිරස්තලයෙනි. එය වඩාත් මාධ්‍ය ආචාර ධර්ම අනුකූල වාර්තාකරණය බව මෙහිදී කිව යුතු වේ.
මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?
#MediaEthicsSL #lka #Divaina #Mawbima